
# සප්ත බොජ්ඣංග



දේශකයාණෝ :

මිතිරිගල නිස්සරණ අරණ්‍ය සේනාසනාධිපති

අති පූජනීය මාතර සිරි ඤාණාරාම මහා ස්වාමීන් වහන්සේ

සංස්කාරක :

පූජ්‍ය මිතිරිගල ධම්ම විසුද්ධි හිමි

# පෙරවදන

අපවත් වී වදාළ මීතිරිගල නිස්සරණ වන ආරණ්‍ය සේනාසනයේ ප්‍රධාන කර්මස්ථානාචාර්ය මහෝපාධ්‍යාය අතිපූජ්‍ය පණ්ඩිත මාතර සිරි ඤාණාරාමාභිධාන මාහිමිපාණන් වහන්සේ·දීර්ඝ කාලීන ආරණ්‍ය වාසයෙන් කාය විවේකය හා චිත්ත විවේකය වළඳන උත්තමයාණන් වහන්සේ නමකි. ශමථ විදර්ශනා භාවනා පිළිබඳ විශේෂ අත්දැකීම් සහිතව කර්මස්ථාන භාවනා පුහුණු කරවන අති දුර්ලභ කර්මස්ථානාචාර්යයන් වහන්සේ නමෙකි. ශීලාදි ගුණයෙන් ප්‍රිය වූ ද එසේ හෙයින්ම ගරු සම්භාවනීය වූ ද අවවාද අනුශාසනා දෙන්නා වූ ද නපුරු වචන ඉවසන සුළු වූ ද ගැඹුරු දහම් පැහැදිලි කර දෙන්නා වූ ද අස්ථානයෙහි නොයොදවා නිර්වාණ මාර්ගයෙහිම යොදවන්නාවූද ශ්‍රේෂ්ඨතම කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමෙකි. මේ ආත්මභාවයේදීම ධ්‍යාන අභිඥා මාර්ගඵල උපදවා නිර්වාණයට පැමිණීමේ උත්තමාධ්‍යාශය ඇත්තාවූ යෝගාවචරයන් වහන්සේලා උදෙසාම ව්‍යවහාර වර්ෂ 1967 දී ප්‍රසිද්ධ වෙළඳ ව්‍යාපාරික අශෝක වීරරත්න මහතා පසුව පූජ්‍ය මීතිරිගල ධම්මනිසන්ති හිමි විසින් ආරම්භ කොට පවත්වනු ලබන මීතිරිගල නිස්සරණ වන ආරණ්‍ය සේනාසනයේ ප්‍රධාන කර්මස්ථානාචාර්ය මහෝපාධ්‍යාය අති පූජ්‍ය පණ්ඩිත මාතර සිරි ඤාණාරාමාභිධාන මාහිමිපාණන් වහන්සේගේ භාවනා කමටහන් දේශනා වනාහී භාවනාභිලාෂී යෝගාවචර සැමදෙනා හටම සඳ හිරු ගමන් ගත් ගුවන්තලය සේ භාවනා මාර්ගය අතිශයින් පිරිසිදුව පැහැදිලි කරන්නේය. මාහිමිපාණන් වහන්සේගේ ඒ දේශනා අතුරෙන් එක් දේශනාවක් කුඩා පොතක් වශයෙන් සකස් කළේ මාහිමිපාණන් වහන්සේට කරන ලද ගුරු පූජාවක් වශයෙනි. සම්බුද්ධ ශාසනයට නව ජීවයක් ගොඩ නංවා අපවත්වී වදාළ අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඤාණාරාමාභිධාන මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේගේ සම්‍යක් ප්‍රාර්ථනා සියල්ල සමෘද්ධවී ප්‍රාර්ථනීය උතුම් බෝධි ඥාණයෙන් ශාන්ති ලක්ෂණ අමෘත මහා නිර්වාණ ධාතුව ඒකාන්තයෙන් සුවසේ සාක්ෂාත් වේවා.

*සබ්බේ සත්ථා භවන්තු සුඛිතත්ථා*

\- මෙයට පූජ්‍ය
මීතිරිගල ධම්ම විසුද්ධි හිමි
ශාන්ත තපෝවනය
කලෝටුවාව, කළගෙඩිහේන.

අන්තර්ජාලයට එක් කිරීම සඳහා pdf ගොනුවක් ලෙස සකස් කරන ලද්දේ -

ශ්‍රී සුමන යෝගාශ්‍රමය
ලෙව්කේ-ගල්අතර-මාවනැල්ල
ශ්‍රී ලංකා

## "නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස"

*" නාඤ්ඤත්‍ර බොජ්ඣංගා තපසා*
*නාඤ්ඤත්‍ර ඉන්ද්‍රිය සංවරා*
*නාඤ්ඤත්‍ර සබ්බ නිස්සග්ගා*
*සන්තිං පස්සාමි පාණිනංති "*

අද ධර්ම දේශනාවට කරුණු කිහිපයක්ම මතක් කරන්න තියෙනවා. පිළිවෙලින් කරගෙන ආවාවූ ධර්ම දේශනා පන්තියේ අවසාන කොටස ආරම්භ කිරීමට තවම බැරිවුනා. මේ අතරේ විශේෂ කරුණක් මතක් කිරීමටයි මේ ගාථාව මාතෘකා වශයෙන් තබා ගත්තෙ. මේ ගාථා ධර්මයෙන් සඳහන් වන කරුණු ටික ඉස්සරවෙලා අපි මතක් කර ගන්න ඕනේ.

භාවනාවේ යෙදෙන යෝගාවචර පින්වතුන්ට ඒ භාවනාව සාර්ථක කර ගැනීමට උපකාර වන්නාවූ ක්‍රම හතරක් මෙහි සඳහන් වෙනවා. නාඤ්ඤත්‍ර බොජ්ඣංග තපසා, නාඤ්ඤත්ත ඉන්ද්‍රිය සංවරා, නාඤ්ඤත්‍ර සබ්බ නිස්සග්ගා, සන්තිං පස්සාමි පාණිනං ති. බුදුරජාණන් වහන්සේගේ මේ දේශනාවෙන් අන්තිම වශයෙන් පෙනෙන්නෙ, අන්තිම අදහස වශයෙන් පෙන්නුම් කරන්නෙ මේ ශාන්තිය, නිවන සළසා ගැනීමයි. ඒ ශාන්තිය සළසා ගැනීමට, නිවන ශාක්ෂාත් කර ගැනීමට කරුණු හතරක් උන් වහන්සේ ඉදිරිපත් කරනවා මිශ්‍ර වශයෙන්. ඒක දේශනා කරන්නේ අනිත් පැත්තටයි. එතකොට නාඤ්ඤත්‍ර බොජ්ඣංගා - කියන්නෙ බොජ්ජංග. බොජ්ජංග නැතිව, තපසා - තපස් නැතිව, තපෝ ගුණය නැතිව, නාඤ්ඤත්‍ර ඉන්ද්‍රිය සංවරා - ඉන්ද්‍රිය සංවරය නැතිව, සබ්බ නිස්සග්ගා - සියල්ල අතහරින්නේ නැතිව මේ සත්වයන්ට ශාන්තියක් පෙනෙන්නෙ නැත කියන අදහසයි මෙයින් කියවෙන්නෙ. එතකොට ශාන්තියක් පෙනෙන්නට නම් මේ කරුණු හතර සම්පූර්ණ කරගන්න ඕනේ. බොජ්ජංග සම්පූර්ණ කරගන්න ඕනේ. තපෝ ගුණ සම්පූර්ණ කරන්න ඕනේ. ඉන්ද්‍රිය සංවරය සම්පූර්ණ කරගන්න ඕනේ. "සබ්බ නිස්සග්ගය" කියන පූර්ණ නෛෂ්ක්‍රම්‍යයය සම්පූර්ණ කරගන්න ඕනේ. මේ කරුණු හතර සම්පූර්ණ වෙනකොට ශාන්තිය සළසා ගන්න පුළුවන්. ශාන්තිය කිව්වෙ නිවන. දුක නිවාලීම එහෙම නැත්නම් කෙලෙස් සංසිඳවාලීම, මේ කොයි වචන වලින් කියවෙන්නෙත් නිර්වාණ මාර්ගයයි. නිර්වාණ ප්‍රතිපත්තියයි. එතකොට මෙහි සඳහන් වන කරුණු අතරෙහි බොජ්ජංගයන් වඩන්නෙ නැතුව ශාන්තිය ලැබෙන්නෙ නෑ කියන එක කාරණයක්. ඒ නිසා ශාන්තිය ලබා ගැනීමට බොජ්ජංග ධර්මයන් වර්ධනය කරගත යුතුයි. ශාන්තිය ලබා ගැනීමට තපෝ ගුණය නැතුව බැහැ. ඒ නිසා තපෝගුණය දියුණු කර ගන්න ඕනේ. ඊලගට ඉන්ද්‍රිය සංවරය නැතුව ශාන්තිය

ලැබෙන්නෙ නෑ. ඒ නිසා ඉන්ද්‍රිය සංවරය දියුනු කර ගන්න ඕනේ. සම්පූර්ණ වූ නෛෂ්ක්‍රම්‍යයය නැතිව ශාන්තිය සැළසෙන්නෙ නැහැ. මේ නිසා ශාන්තිය සළසා ගැනීමට පූර්ණ වූ නෛෂ්ක්‍රම්‍යයක් අවශ්‍යයයි. බොජ්ජංග ධර්ම අවශ්‍යයයි. තපෝ ගුණ වශයෙන් කියන්නාවූ සල්ලේඛ ප්‍රතිපත්තිය, ධූතාංග වශයෙන් සඳහන් වන සල්ලේඛ ප්‍රතිපත්තිය වෙනුවටයි මේ තපෝ ගුණ කියලා බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ කියන එක අටුවා වල සඳහන් වෙනවා. එතකොට ඊලඟට සම්පූර්ණ ඉන්ද්‍රිය සංවරය අවශ්‍යයයි. ඊලඟට නෛෂ්ක්‍රම්‍යයය. ඉතින් මේ පිළිවෙල මොකක්ද කියන එක ඊලඟට හිතා ගන්න ඕනේ. විශාල වශයෙන් අභ්‍යන්තරයෙ දියුණු කරගත යුතු ධර්ම පරම්පරාව බොජ්ජංග. ඒක ඉස්සරවෙලා පෙන්නුවා උන් වහන්සේ. මේ බොජ්ජංග ධර්ම උන් වහන්සේ පෙන්නුම් කළේ රත්නයක් පෙන්නුම් කරන්නා වාගේ. මැණිකක් පෙන්නුම් කරන්නා වාගේ. මෙන්න මේ ටික අභ්‍යන්තරයෙ වර්ධනය කරගන්න ඕනේ. එතකොටයි බලාපොරොත්තු සාර්ථක කරගන්න පුළුවන් වෙන්නෙ. ශාන්තිය බලාපොරොත්තුවෙන්, ආපේක්ෂාවෙන් ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් මේක දෙන නිසා ඒ පුද්ගලයගෙ අදහසට අනුව උන්වහන්සේ මේකේ තත්වය, බැරෑරුම් තත්වය පෙන්නුම් කරමින් බොජ්ජංග ධර්මයන් මුලින් සඳහන් කලා. ඊලඟට මෙම බොජ්ජංග ධර්ම දියුණු කර ගැනීමට අවශ්‍ය සල්ලේඛ ප්‍රතිපත්තිය පෙන්නුම් කළා තපෝ ගුණය වශයෙන්. ධූතාංග ගුණ දියුණු කරගන්න ඕනේ. තමන්ගේ ශක්ති පමණින් ධූතාංග ගුණ දියුණු කර ගන්න ඕනේ. ධූතාංග ගුණ නැතුව නිවන ලැබෙන්නෙ නෑ කියන අදහස ප්‍රථමයෙන් තේරුම් ගන්න ඕනේ. තමන්ගේ ශක්තියේ හැටියට එක ධූතාංගයක්වත් රැකෙන තාලෙට තියෙන්න ඕනේ. ඒක සල්ලේඛ ප්‍රත්පත්තියයි. සල්ලේඛ ප්‍රතිපත්තිය කිච්චහම ඒක විශාල ප්‍රතිපදාවක්. ඒ ධූතාංග දහ තුනක් තියෙනවා. ඒක මේ ඇත්තො දන්නවා. මේ යෝගාවචරයන්ට ඒක තේරුම තියෙනවා. එයින් යම්කිසි කොටසක්, මොකක් හරි තමන් තුළ වර්ධනය කර ගන්න ඕනේ. ධූතාංග අතහැර බැහැ කියන අදහසයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නෙ. ඒ නිසා අර බොජ්ජංග ධර්ම දියුණු කර ගැනීමටත් උපකාර වෙනවා මෙන්න මේ ටික කියලා තපෝ ගුණ වශයෙන්, තපසා කියලා උන් වහන්සේ දේශනා කළා. ඊලඟට ඉන්ද්‍රිය සංවරය. තපෝ ගුණ දියුණු වෙන්නා වූ අවස්ථාවේදී ඒකට මූලික වෙනවා ඉන්ද්‍රිය සංවරය. ඉන්ද්‍රිය සංවරය හොඳට රැකෙන්න ඕනේ. ඊලඟට ඉන්ද්‍රිය සංවරය ආරක්ෂා කර ගැනීමටත් මුලින් අධිෂ්ඨාන වශයෙන් තියාන්න ඕනේ නෙක්ඛම්මය. ගිහි ගෙයින් අයින් වීම නෙක්ඛම්මයයි. එපමණක් නොවෙයි. ඒක අකුසලයන්ගෙන්, සියළු අකුසලයන්ගෙන්, සියළු අකුසල් අදහස් වලින්, නීවරණ මුල් කරගෙන තිබෙන්නාවූ සියළු අකුසල් වලින්

අයින් වීමයි නෙක්ඛම්මය කියන්නෙ. ඒ නෙක්ඛම්මයයි සබ්බ නිස්සග්ගය වශයෙන් සඳහන් වෙන්නේ. සියල්ල අතහරින්නෙ නැතුව ශාන්තිය ලැබෙන්නෙ නැහැ. මේ කරුණු හතරෙන් අපට ඉදිරිපත් කරගන්න තියෙන්නෙ දැන් බොජ්ජංග ධර්ම ගැනයි.

බොජ්ජංග ධර්ම සම්බන්ධව සළකන්න තියෙන්නෙ දැන් "සබ්බාසව සූත්‍රයේ" දස්සනා පහාතබ්බ ආශ්‍රවයන් වශයෙන් වදාළෙ දිට්ඨි, විචිකිච්චා, සීලබ්බත පරාමාස කියන මේවයි. මේවා මේ කෙලෙස් අයින් කිරීම ඒ අයින් කිරීමට උපකාර වන්නාවූ අන්දම ප්‍රකාශ කරන්නාවූ උන් වහන්සේ යෝනිසෝ මනසිකාරයෙන්, සංස්කාර ධර්මයන් පිළිබඳව නොකඩවා පැවති මනසිකාරය අවශ්‍ය බව පෙන්වනවා. එතකොට ඒ අනුව චතුරාර්ය සත්‍යයන් පිළිබඳව වැටහීම අවශ්‍යයයි කියලා පෙන්නුවා. එතකොට චතුරාර්ය සත්‍ය පිළිබඳව වැටහීමට අර මුලින් සඳහන් වන අන්දමට යෝනිසෝ මනසිකාරය පවත්වන්නට ඕනේ. මේ නිසා ප්‍රථම මාර්ග ඥාණය දියුණු කරන්න බලාපොරොත්තු වන්නාවූ යෝගාවචරයන්ට බොජ්ජංග ධර්මයන් සම්බන්ධව ප්‍රශ්නයක් මතුකරන්න උවමනා නැහැ. බොජ්ජංග ධර්ම පිළිබඳව ප්‍රශ්න පැන නගින්නේ දෙවෙනි අවස්ථාවෙ සිටයි. මුල් අවස්ථාවේදී බොජ්ජංග ධර්ම සාමාන්‍යයෙන් වැඩෙනවා. නමුත් එතන නම් වශයෙන් වෙනම භාවනා වශයෙන් දියුණු කරගත යුතු දේ වශයෙන් ඉදිරිපත් කරන්නෙ නෑ. එතන චතුරාර්ය සත්‍ය දර්ශනයක් විතරයි. මුල් මාර්ගයේදී අවශ්‍ය වෙන්නෙ චතුරාර්ය සත්‍යයන් පිළිබඳව නියම, ප්‍රත්‍යක්ෂ දර්ශනයයි එතනදි උවමනා කරන්නෙ. බොජ්ජංග ධර්මයන් සම්බන්ධව බුදුරජාණන් වහන්සේ වදාළෙ ,භාවනා පහා තබ්බ, කාරණයන් සම්බන්ධවයි. ,කතමේච භික්කවේ ආසවා භාවනා පහා තබ්බා, ඉධ භික්කවේ භික්ඛු සති සම්බොජ්ජංගම් භාවේති, විවේක නිස්සිතං විරාග නිස්නිතං වොස්සග්ග පරිණාමිං, කියලා ඔය විදිහට බොජ්ජංග ධර්මයන්ට අවස්ථාව උන් වහන්සේ පෙන්නුවෙ උපරිමාර්ග පිළිබඳ කටයුතු වලදි. මුල් මාර්ගය පිළිබඳව වැඩ වලදි බොජ්ජංග ධර්මයන් සම්බන්ධව එක්තරා තරමකට වැඩෙන බව සැබෑව. නමුත් ඒ වැඩීමක් නෙමෙයි ලැබීමයි එතන තියෙන්නෙ. බොජ්ජංග ධර්මය ලැබීමයි එතන තියෙන්නෙ. බොජ්ජංග ධර්මයන් තමාට ලැබෙනවා, අධ්‍යාත්ම වශයෙන් තමාට ලබාගන්න අවස්ථාව සැලසෙනවා මේ ප්‍රථම මාර්ගයේදී. දෙවෙනි මාර්ගයෙ පටන් ලැබුණු බොජ්ජංග ධර්මයන් වර්ධනය කර ගන්න ඕනේ. එය වර්ධනය කරගත යුතු බවයි මේ "භාවනා පහා තබ්බ" ආශ්‍රවයන් පෙන්නුම් කරන්නාවූ අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ වදාළේ. "විවේක නිස්සිතං, විරාග නිස්සිතං වොස්සග් පරිණාමිං" සිතිසම්බොජ්ජග්ගං භාවෙන්ති" අන්න සති සම්බොජ්ජංගය වඩනවා. වර්ධනය කර ගන්නවා.

ඒ සති සම්බොජ්ඣංගය, ධම්ම විචය සම්බොජ්ඣංගය, විරිය සම්බොජ්ඣංගය, පීති සම්බොජ්ඣංගය, පස්සද්ධි සම්බොජ්ඣංගය, සමාධි සම්බොජ්ඣංගය, උපේක්ඛා සම්බොජ්ඣංගය කියන මෙන්න මේ බොජ්ඣංග හත "භාවනා පහා තබ්බ! ආශ්‍රවයන් පෙන්නුම් කරන්නාවූ අවස්ථාවේදී දේශනා කළේ. මෙන්න මේ බොජ්ඣංග ධර්මයන් නොවැඩීමෙන් යම්කිසි ආශ්‍රවයක් පහළ වෙනවනම් වැඩීම නිසා ඒ ආශ්‍රවයන් නැති වෙනවා. නැති කරන්න පුළුවන් වෙනවා කියලයි. උපරි මාර්ගයන් සම්බන්ධවයි ඒ කථාව. මෙන්න මේ නිසා "උපරි මාර්ග" භාවනාව සම්බන්ධව සිත යොදන්නාවූ පින්වතුන්ට බොජ්ඣංග ධර්මයන් සම්බන්ධව සෑහෙන තේරුමක් තබාගන්න ඕනේ. අර ගාථාවට සම්බන්ධ බොජ්ඣංග කියන මේ කථාවට ගැළපෙන නිසයි මේ ටික කියන්ට බලාපොරොත්තු වෙන්නේ. එතකොට මේ බොජ්ඣංග, සම්බොජ්ඣංග කියලා වචන දෙකක් තියනවා. මේ වචන දෙකම එක අදහසට වැටෙන තැනුත් තියනවා අදහස් දෙකකට වැටෙන තැනුත් තියනවා. සති, ධම්ම විචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි උපේක්ඛා කියන මේ හත බොජ්ඣංග වෙලත් හිටිනවා. සාමාන්‍ය ගුණධර්ම වශයෙනුත් හිටිනවා. සම් බොජ්ඣංග වශයෙනුත් හිටිනවා. මේ බොජ්ඣංග ධර්මයන් මේ දේශනාවේ සම්බොජ්ඣංග නමින් සති සම්බොජ්ඣංගං, ධම්ම විචය සම්බොජ්ඣංගං, විරිය සම්බොජ්ඣංගං, පීති සම්බොජ්ඣංගං. පස්සද්ධි සම්බොජ්ඣංගං, සමාධි සම්බොජ්ඣංගං, උපේක්ඛා සම්බොජ්ඣංගං වශයෙන් සඳහන් වෙනවා. එතකොට මේකේ ගන්න අදහස් දෙකක් තියනවා. සාමාන්‍ය ජීවිතයකට උපකාර වන බොජ්ඣංග ධර්ම තියනවා. ජීවිතය හොඳින් දැහැමිව නියම අන්දමට පවත්වාගෙන යන්නට බලාපොරොත්තු වන පින්වතුන්ට මේ බොජ්ඣංග ධර්ම අවශ්‍යයයි. හොඳට සතිය තියාගන්න පුළුවන් වෙනවා. ගිහි ගෙයි වාසය කරන පින්වතුන් සම්බන්ධව කථා කරන කොට තමන්ගේ කටයුතු වලදී, රැකීරක්ෂා වලදී, ගමන් බිමන් වලදී, කථාවෙදි, සාකච්ඡාවේදී සතිය තියාගෙන කටයුතු කරනවා. එතකොට ධම්ම විචය වශයෙන් නුවණ තියාගෙන කටයුතු කරනවා. වීර්යය තියාගෙන කටයුතු කරනවා නොපසුබටව. එතකොට පස්සද්ධිය කියන්නෙ සැහැල්ලු තත්වයක් තියාගෙන කටයුතු කරනවා. හිතේ තැන්පත්කම තියාගෙන කටයුතු කරනවා. මධ්‍යස්ථතාවයෙන්, උපේක්ෂාවෙන් යුක්තව කටයුතු කරනවා. එතකොට ඒ කටයුතු සාර්ථකව ගෙනියන්න පුළුවන් සාමාන්‍ය ලෞකික වශයෙන්. එතකොට ඒවා බොජ්ඣංග කියන නාමයට අඩංගු වෙන්නෙ නැහැ. මක්නිසාද අඩංගු නොවෙන්නේ ? අර බොජ්ඣංග කියන වචනය වෙන්කළහම "බෝධි අංග" කියන එකයි තියෙන්නෙ. එතකොට සම්බොජ්ඣංග කියන්නෙ විශේෂ තේරුමක් ඇතුවයි "සං" යන්න යොදන්නෙ. එතකොට සාමාන්‍ය වශයෙන් "බෝධි අංග"

බෝධි කියන්නෙ බෝධි වුච්චති චතුසුමග්ගේසු ඤාණං, චතුමග්ග ඤාණං මාර්ග සතරෙහි ලැබෙන ඤාණය එනම්, සොතාපත්ති මග්ග ඤාණය, සකෘදාගාමී මග්ග ඤාණය, අනාගාමී මග්ග ඤාණය, අරහත්ත මග්ග ඤාණය කියන මේ ඤාණ හතරටයි "බෝධි" කියන්නෙ. එහෙම නැත්නම් සතර මාර්ග ඤාණයට බෝධිය කියන නම ව්‍යවහාර කරනවා. ඒ මාර්ග හතරෙ ලැබෙන ඤාණ හතරට "බෝධි" කියන්නෙ මක් නිසාද? චතුස්සත්‍ය ධර්මයන් අවබෝධ කරන නිසයි. "බුජ්ඣති බෝධි" එතකොට චතුස්සත්‍ය ධර්මයන් අවබෝධ කරන්නා බෝධියයි. මේ අවබෝධය කියන එක සාමාන්‍ය වශයෙන් 'දැනීමට' කියන වචනයක් බව පෙනෙනවා. නමුත් සාමාන්‍ය දැනීම නෙමෙයි එතන තියෙන්නෙ. අර ප්‍රතිඝාතය නැතිව, ප්‍රතිඝාතය කියන්නෙ හැප්පිලි නැතිව අරමුණ විනිවිද තේරුම් ගැනීමයි ප්‍රතිවේදය කියන්නෙ. ප්‍රතිඝාතයක් නැතිව අරමුණ විදගෙන තේරුම් ගැනීම, විදගෙන කෙළවරට තේරුම් ගැනීමයි ප්‍රතිවේධය කියන්නෙ. ප්‍රතිඝාතය කියන්නෙ බාධාව. ප්‍රතිවේද ඤාණය ඇතිවෙන්නාවූ අවස්ථාවේදී බාධා තියනවනම් ඒ බාධා අයින් වෙනවා. කෙළෙස් තමයි බාධා වෙන්නෙ. සාමාන්‍යයෙන් අවිද්‍යාව, නීවරණ වගේ දේවල් බාධා වෙනවා. ඒ බාධා නැතිවයි මේ අවබෝධය සැළසෙන්නෙ. ඒකටයි මේ ප්‍රතිවේධය කියන්නෙ. මේ ප්‍රතිවේධය කියන තේරුමක් ඇති එකක් මේ "බෝධිය" කියන වචනයෙ තියෙන්නෙ. සාමාන්‍යයෙන් ඒ ප්‍රතිවේධය කියන එකෙත් තියනවා එක එක තත්ව. ප්‍රථම මාර්ග ඤාණයෙ ප්‍රතිවේධයට වඩා අමුතුයි, ශක්තිමත් දෙවෙනි එක. ඊට වඩා ශක්තිමත් තුන්වෙනි එක. ඊට වඩා ශක්තිමත් හතරවෙනි මාර්ග ඤාණය. ඒ වාගේම සාමාන්‍ය රහතන් වහන්සේගේ ප්‍රතිවේධයට වඩා විශේෂයක් තියනවා මහා ශ්‍රාවක තත්වයට පැමිණි රහතන් වහන්සේගෙ. මහා ශ්‍රාවක තත්වයට පැමිණි රහතන් වහන්සේගේ ප්‍රතිවේධය අරට වඩා ශක්තිමත්. ඒ වගේම සම්පූර්ණයි. ඊට වඩා සම්පූර්ණයි අග්‍ර ශ්‍රාවක වහන්සේලාගේ ප්‍රතිවේධය. ඊට වඩා සම්පූර්ණයි පසේ බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිවේධය. සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිවේධය මේ හැමටම වඩා ශක්තිමත් ඒ ප්‍රතිවේධය. මෙන්න මේ හැම එකකටම කියන්නෙ, හැම තැනටම කියන්නෙ 'බෝධි' යන වචනය. මේක තැනේ හැටියට උසස් වෙනවා පහත් වෙනවා. මෙන්න මේ විදිහෙ මේ බෝධිය කියන ඤාණයයි කියන්නෙ. "අංග" කියන්නෙ උපකාරක ධර්මයටයි. සාමාන්‍යයෙන් "අංග" කියනවා අවයව වලට. ඒත් මෙතන කියන්නෙ ප්‍රත්‍ය, උපකාරක ධර්මය, හේතුව, කාරණය කියන වචන වලින් සඳහන් වන තේරුමකටයි. එතකොට බෝධිය කියන මේ ඤාණ වලට උපකාර ධර්මයි බොජ්ජංග, සම්බොජ්ජංග කියන්නෙ. සම්බොජ්ජංග කියන්නෙ විශේෂ, සම්පූර්ණ කියන

තේරුමයි. ඒක උසස් තත්වයෙන් යෙදෙනකොට. බොජ්ජංග කියන්නෙත් ඒකමයි. මේ විදිහට අර බෝධි කියන සතර මාර්ග ඥාණයන් ලබා ගැනීමට යම් ධර්ම කොටසක් උපකාර වෙනවා නම්, සරණ වෙනවානම් ඒ උපකාර වීම තියනවා දෙවිදිහකට. සාමාන්‍යයෙන් උපකාර වෙනවා දෙවිදිහකට. ඒ හේතු ධර්මය උපකාරය ලබන ධර්මය එක්ක එකට යෙදිලත් හිටිනවා, උපකාර වෙනවා. එකට එක්වෙන්නෙ නැතුවත් උපකාර වෙනවා. ඒක සාමාන්‍යයෙන් ශාස්ත්‍රීය වශයෙන් උගන්වනකොට සහකාරි කාරණය කියලයි ඒකට කියන්නෙ. සමවායි අසමවායි, නිමිත්ත කියන තුන් ආකාරයකට කියනවා මේ ප්‍රත්‍යවීම. සමවායී කාරණය, අසමවායී කාරණය, නිමිත්ත කාරණය ඔය ශාස්ත්‍රීය ඉගැන්වීම් වල එහෙම තියනවා. එයින් සමවායී කියන සහකාරි කාරණය කියන එකයි මෙතනදි ලැබෙන්නෙ. ඒ කියන්නෙ මේ බොජ්ජංග වශයෙන් කියන, ධර්ම වශයෙන් කියන මේ සති, ධම්ම විචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපේක්ඛා කියන මේ හත අර බෝධි කියන සතර මාර්ග ඥාණයට උපකාර වෙනකොට උපකාර වෙන්නෙ එකට යෙදිලා. අයින් වෙලා නෙමෙයි. දැන් නූලයි වස්ත්‍රයයි වගේ. වස්ත්‍රයක් ගත්තහම නූලයි වස්ත්‍රයයි දෙක එකට තියෙන්නෙ. නූල් නිසා වස්ත්‍රය. නූල් හේතුවෙන් වස්ත්‍රය. ඒ නූල් හේතුවෙන් වස්ත්‍රය කීවට නූලයි වස්ත්‍රයයි දෙකම එකට තියෙන්නෙ. ඒ වාගේ මෙතන සහකාරි හේතුවයි කීවෙ දෙක එකට යෙදිලා. අර මේ ධර්ම සමූහය එකට යෙදිලයි පහළ වෙන්නෙ අර බෝධි කියන මේ ඥාණ සමූහය. එතකොට කොච්චර උපකාර වෙනවද කොපමණ ළඟින් මේවා සැළසෙනවද කියන එක මෙන්න මේ තේරුම් අනුව අපට හිතාගන්න පුළුවනි මේ බොජ්ජංග ධර්මයන් සම්බන්ධව.

දැන් අපි සළකා බලමු මේකෙන් එකක් ගැන. සති සම්බොජ්ජංගය ගැන බලමු. සති සම්බොජ්ජංගය කිව්වෙ සතිය, ඉස්සරවෙලා සතිය ගන්නවා. සම්බොජ්ජංගය කීවේ මාර්ග ඥාණ වලටනෙ. එතකොට වචන අර්ථය වශයෙන් ගන්න ඕනේ මාර්ගඥාන වලට උපකාර වන්නාවූ සතිය වශයෙන්. එතකොට අනිත් අතට ධම්මවිචය සම්බොජ්ජංගය කියන්නෙ මාර්ගඥාණ වලට එකට යෙදීමෙන් උපකාර වන්නාවූ විදර්ශනා ඥාණ සමූහයටයි. විරිය සම්බොජ්ජංගය කිව්වෙ ඒ චතුර්මාර්ග ඥාණයන්ට උපකාර වන්නාවූ සතර ආකාර සම්‍යක් ප්‍රධාන වීර්‍ය සමූහයටයි. ඒකත් එකට යෙදිලයි ඒකෙ තියෙන්නෙ. පීති සම්බොජ්ජංගය කියන්නෙ මාර්ගඥාණ වලට උපකාර වන්නාවූ ප්‍රීතියටයි. එතකොට ඊලඟට පස්සද්ධිය කියන්නෙ මාර්ගඥාණයට උපකාර වන්නාවූ සැහැල්ලුකමටයි. කයේ හිතේ සැහැල්ලුකමටයි. සමාධි සම්බොජ්ජංගය කියන්නෙ ඒ මාර්ගඥාණ වලට උපකාර වන්නාවූ හිතේ තැන්පත්කමටයි. උපේක්ඛා සම්බොජ්ජංගය

කියන්නෙ ඒ මාර්ගඥානයන්ට උපකාර වන්නාවූ මැදහත් භාවයටයි. මධ්‍යස්ථ භාවයටයි. මෙන්න මෙහෙම වචනාර්ථ වශයෙන් කෙටි තේරුම් හරිගස්සගන්න පුළුවන්. ඊලඟට අපි සති සම්බොජ්ජංගයට බහින්න ඕනේ. සතිය, බොජ්ජංග වශයෙන් ලැබෙන්නාවූ මේ සතිය ගන්නාවූ අවස්ථාවේදී නොකඩවා ලැබෙන සතියයි ගන්න ඕනේ. අතරින් පතර ලැබෙනවා සතිය. ඒ අතරින් පතර ලැබෙනවා අතරින් පතර කැඩෙනවා. ඒක නෙවෙයි මෙතන ගන්න ඕනේ. නොකඩවා පවත්වන්නාවූ සතිය. මේ සතිය යම් ධර්ම සමූහයක් සම්බන්ධව පාවිච්චි කරනවනම් යොදනවානම් ඒ යොදන්නාවූ අවස්ථාවේදී මේ සතියෙන් කෙරෙනවා ක්‍රියා දෙකක්. සාමාන්‍ය වශයෙන් සිතට පහළ වනනාවූ ප්‍රමාද පක්ෂය තියනවා. ප්‍රමාද පක්ෂය කියන්නෙ සිත ප්‍රමාදයේ හෙළන කෙලෙස් සමූහයට. එතකොට ඒවා වචන වශයෙන් කියනවනම් අවිද්‍යාව, එතකොට නීවරණ ධර්ම, මිත්‍යා දෘෂ්ඨි ආදී කෙලෙස් සමූහයක් කියන්න පුළුවන්. එකක් එකක් පාසා නොකීවත් සිතට ගන්න පුළුවන් වෙන්න ඕනෙ කෙනෙකුන්ගේ හිත පහත හෙළන්නාවූ, වැඩ නවත්වන්නාවූ, ගෙනයන වැඩ පිළිවෙලට හරස් වන්නා වූ යම්කිසි ඒ සිතුවිලි ගොඩක් ඇත්නම් ඒ සියල්ලම ප්‍රමාද පක්ෂය කියලයි ගණන් ගැනෙන්නෙ. සිතට ඔය විදිහට ප්‍රමාද පක්ෂයට හේතු වන්නාවූ ප්‍රමාද පක්ෂයට වැටෙන්නාවූ, ඇතුල්වෙන්නාවූ කෙළෙස්ගොඩක් තියනවා. මේ කෙළෙස් ගොඩ අයින් වෙනවා මේ සතියෙන්. මේ සතියේ බලයෙන් කෙරෙන්නෙ අර ප්‍රමාද පාක්ෂික කෙළෙස් ගොඩ අයින් කරනවා.

සතිය පාවිච්චි වෙනවනම් නියම අන්දමට අර ප්‍රමාද පක්ෂයෙ තියෙන කෙලෙස් ටික අයින් වෙනවා. ඒ අයින් වෙනවා හා සමඟම කෙරෙනවා තවත් වැඩක්. අප්‍රමාද ගුණය පිරෙනවා. යම්කිසි තැනක, යම්කිසි භාජනයක නරක දේවල් තියනවානම් නරක වතුරක් තියෙනවනම් ඕකට අළුත් වතුර දාන්න අර පරණ තිබ්බිච්ච නරක වතුර ටික අයින් වෙනවා. කුණු වතුර ටික අයින් වෙනවා. කුණු වතුර අයින් වෙන්නා වාගේ හිතට සම්බන්ධ වෙන මේ කෙළෙස්, මේ සතිය නිසා, ප්‍රමාද පාක්ෂික වූ කෙළෙස් මේ සතිය පාවිච්චි කරන්න කරන්න කෙළෙස් අයින් වෙනවා. ඒ එක්කම අප්‍රමාද පාක්ෂික, අප්‍රමාද ගුණය, අප්‍රමාද පාක්ෂික ගුණ සමූහයක් එයින් ක්‍රමයෙන් පිරෙනවා. යම් කිසි තැනකට හොඳ වතුර පිරෙන්නා වාගේ අප්‍රමාදය දියුණු වීමට උපකාර වන්නා වූ වටිනා ගුණ රාශියක් සිතේ අභ්‍යන්තරයේ වැඩෙනවා. පිරෙනවා. බොජ්ජංග වශයෙන් කෙරෙන මේ සතියෙන් කෙරෙන වැඩය හොඳට තේරුම් අරගෙන තියෙන්න ඕනේ. සතිය නිකං පාවිච්චි කරන එක නෙමෙයි. සතිය සතිය කියලා නිකං කිව්වට මදි.

මෙන්න මේ වැඩ දෙක කෙරෙන හාලෙටයි සතිය තමා තුළ දියුණු කරගන්න ඕනේ. ප්‍රමාද පාක්ෂික කෙළෙස් විදමනය කරලා විද්වංසන කරලා අප්‍රමාද පාක්ෂික ගුණ ධර්මයන් පුරවාලීමෙන් මේ සතිය පාවිච්චි වෙනවා. මේ සතිය පාවිච්චි වෙන්නාවූ අවස්ථාවේදී මෙන්න මේ බොජ්ජංග තත්වයයි සැළසෙන්නෙ. එතකොට ඔය විදිහට යනකොට ප්‍රමාද පාක්ෂික කෙළෙස් අයින් වෙනවා. පිරිසිදු වෙනවා සිත. ඒ පිරිසිදුව සමගම අප්‍රමාද පාක්ෂික ගුණ සමූහයක් ඒ හිතේ පිරෙනවා. ඒ පිරීමෙන් මේ සතිය, පුරවන්නාවූ මේ සතිය දියුණු වෙමින් දියුණු වෙමින් ගිහිල්ලා අර චතුර්මාර්ග ඥාණයන් ලැබීමට මෙය උපකාර වෙනවා. ඒ උපකාර වෙන්නෙ ඈතින් ඉඳගෙන නෙමෙයි. මුලින් ටිකෙන් ටික ටිකෙන් ටික ඈතින් ඉඳගෙන කරගෙන කරගෙන දියුණු කරගෙන ගිහිල්ලා මේ වැඩ දෙකයි කරන්නෙ. ඒක කරගෙන ගිහිල්ලා අන්තිමේදී ප්‍රමාද පක්ෂය සම්පූර්ණයෙන්ම අයින් වෙනවා. අප්‍රමාද පක්ෂය සම්පූර්ණ වෙනවා, කිට්ටු වෙනවා. එතනදී අන්න අර චතුර් මාර්ග ඥාණ ළඟට මේ සතිය එකතු වෙනවා. එකතු වීමෙන් චතුර් මාර්ග ඥාණයන් මතු කිරීමට උපකාර වෙනවා. මෙන්න මේකයි සති සම්බොජ්ජංගයන්ගෙන් කෙරෙන්නාවූ වැඩේ. ඉතින් මෙන්න මේ තේරුම හරිගස්ස ගන්න ඕනේ.

ඊළඟට ධම්ම විචය සම්බොජ්ජංගය කියන්නෙ අපි මතක් කලා මුලින් ධම්ම විචය කියන්නෙ විදර්ශනා චිත්ත පරම්පරාවයි කියලා. ධම්ම විචය. ධම්ම කිව්වෙ විදර්ශනා ඥාණයක් පැවැත්වීමට අරමුණු වශයෙන් ගන්නා ධර්ම සමූහයටයි. ප්‍රඥාභූමි, විදර්ශනා භූමි කියලයි ඒවට කියන්නෙ. ප්‍රඥා භූමි නිද්දේශය කියලා ඔය විසුද්ධි මාර්ගයෙ එහෙම සඳහන් වෙන්නෙ විදර්ශනා ඥාණ වලට භූමි වන ධර්ම වලටයි. එතකොට මොනවද පංච උපාධානස්කන්ධ, ධාතු, ආයතන, ඉන්ද්‍රිය, පටිච්ච සමුප්පාද ඔන්න ඔය ධර්ම. ධර්ම වශයෙන් ගන්නෙ ඔයදේවල්. ඒ ධර්මයන් "විචය" කියන්නෙ "විචිනාටී විචයෝ" ඒ කියන්න සෙවීම. වෙන වචන වලින් කියනවනම් ඔය කර්මස්ථානාචාර්යවරයන් වහන්සේලා කියනවා "සල්ලක්ඛණ" චිත්ත පරම්පරාව කියලා. මෙනෙහි කරන චිත්ත පරම්පරාව, නොකඩවා මෙනෙහි කරගෙන යන චිත්ත පරම්පරාව කියලා. එතකොට මෙන්න මේ විදර්ශනාවට භූමිය වූ යම්කිසි මේ ධර්ම සමූහයක් ඇත්නම් ඒවා සැළකීමයි ධම්ම විචය කියන්නෙ. මේක විදර්ශනාව පටන් ගන්නාවූ අවස්ථාවේදී ලැබෙනවා. මේ ධම්ම විචය සම්බොජ්ජංගය ලැබෙනවා. ඒත් වැඩීම වෙන්නෙ නෑ මුලදී. මුල් මාර්ගයෙදි වැඩීමක් වෙන්නෙ නෑ. ඒ බොජ්ජංග ධර්මයන් වඩන්නෙ අර දෙවෙනි අවස්ථාවේ කියලයි මුලදී මතක් කලේ ඒ නිසා. එතකොට මේ ධම්ම විචය වශයෙන් සඳහන් වන ධර්ම සමූහයක් සම්බන්ධව හොඳට හිතාගත යුතු වූ දෙයක් තියනවා. මොකද මේ විදර්ශනා ඥාණ පරම්පරාව

අර විදර්ශනාවට යොමු කර ගන්නා වූ අරමුණු වල පංච උපාදානස්කන්ධ ආදී ධර්ම කොටස් වල යොදන්නාවූ අවස්ථාවේදී විදර්ශනාව පවත්වාගෙන යනවා, සැළකීම සල්ලක්ඛණ චිත්ත පරම්පරාව යොදාගෙන යනවා. ඒ සල්ලක්ඛණ චිත්ත පරම්පරාව කියන්නෙ මෙනෙහි කිරීමේ වැඩ පිළිවෙල. ඒක මුලින් කලා. ඊලගට එකක් එකක් පාසා සැලකීම. මේ ධර්ම මේකයි මේ ධර්ම මේකයි කියලා සැලකීම. ඒකෙ තේරුම දැන් ඔන්න ආරම්භය සම්බන්ධව අපි කල්පනා කරලා බලමු. සතිය මුලින් තියාගෙන හොඳින් ආනාපාන භාවනාවට හිත යොදාගෙන ඉන්නවා. ආනාපාන භාවනාවට හිත යොදාගෙන ඉන්නාවූ අවස්ථාවේදී ඒක සම්පූර්ණ වුනහම ඊලගට මුළු පංච ස්කන්ධයටම හිත යෙදෙනවා. මුළු පංච ස්කන්ධයේම හිත පැතිරිලා හිටිනවා. ඒක එක පාරට තේරෙන්නෙ නැහැ.

ආනාපාන දෙක හොඳට වැටහුනා නම් පැතිරිලා ඒක අඩුවක් පාඩුවක් නැතිව සමාධිමත් හිතකට හොඳට පෙනුන නම් ආනාපාන දෙක ඊලගට පෙනෙන්නෙ ආනාපාන දෙකට සම්බන්ධ වෙච්ච ශරීරය. ඒ ශරීරය මේ පංචස්කන්ධ වශයෙන් සළකන්න පුළුවන් වෙනවා මුළු ශරීරයටම හිත යොදලා. පුංචි දේකට හිත යොදාපු අවස්ථාව වාගේ මුළු පංචස්කන්ධයටම එක වරට හිත යොදන්න පුළුවන් වෙනවා, ශක්තියක් ලැබෙනවා යෝගාවචරයාට මේ සල්ලක්ඛණ චිත්ත පරම්පරාව දියුණු වෙනකොට. සල්ලක්ඛණ චිත්ත පරම්පරාව හොඳට දියුණු වෙන්නාවූ අවස්ථාවේදී මුළු පංචස්කන්ධයම සම්පූර්ණයෙන් එකට එකතු කරලා තේරුම් ගන්න පුළුවන් තත්වයකට පැමිණෙනවා අර ඥාණය දියුණු වෙනකොට. මෙන්න මේ විදිහට මේ ධම්ම විචය කියන සල්ලක්ඛණ චිත්ත පරම්පරාව දියුණු වෙමින් දියුණු වෙමින් ගිහිල්ල අන්තිමේදී කෙළෙස් ක්‍රමයෙන් අයින් වෙලා, ඒකට බාධකව තිබුණ කෙළෙස් සම්පූර්ණයෙන්ම අයින් වෙනවා. ඒ අයින් වෙන ක්‍රමය මුලින් අපි සඳහන් කලා. අට්ඨාරස විපස්සනා ක්‍රමයෙදි ඒ ඉදිරිපත් වෙන බාධක කෙළෙස් සමූහයක් ඒයින් උපකාර වන ධර්ම සමූහයක් මතක් කළා. ඒ අනුව ක්‍රමයෙන් කෙලෙස් අයින් වෙනවා ඒ වෙනුවට උපකාරක ධර්ම ළගාවෙනවා. දියුණු වෙනවා. මේ දියණු වෙන්නෙ හිතේ. ඔහොම දියුණු වේගන දියුණු වේගන ගිහිල්ලා අන්තිමේදී දියුණුව කෙළවරදි කුමක්ද වෙන්නෙ මේ ධම්ම විචය සම්බොජ්ජංගයමයි අන්තිමේදි අර චතුර්මාර්ග ඥාණ වෙන්නෙ. අර සති සම්බොජ්ජංගය මේ චතුර්මාර්ග ඥාණයට උපකාර වෙනවා කිව්වා වගේ මෙතන මේ ධම්ම විචය සම්බොජ්ජංගයමයි අන්තිමේදී මාර්ග හතරෙ ඥාණය කියන්නෙ. චතුර් මාර්ග ඥාණයට

පෙරළෙන්නෙ මේ ධම්ම විචය සම්බොජ්ජංගයමයි. අන්න ඒකයි මේකෙ තිබෙන වෙනස වශයෙන් හිතාගන්න තිබෙන්නෙ.

ඊළඟ ගන්න තියෙන්නෙ විරිය සම්බොජ්ජංගය. මේ විරිය සම්බොජ්ජංගය ලැබෙනකොට විරිය, වීර්ය කියන්නෙ සතර සම්‍යයක් ප්‍රධාන වීර්යටයි. ඒක දන්නවා මේ ඇත්තො. සතර සම්‍යයක් ප්‍රධාන වීර්යය යෙදෙන කොට ඒකට විරුද්ධව තිබෙන්නාවූ කුසීත පක්ෂයක් තිංබෙනවා ,කෝසජ්ජ, පක්ෂය කියලා. ඒ කෝසජ්ජ පක්ෂය මර්දනය වෙනවා. මැඩෙනවා. නැත්නම් විදමනය වෙනවා, අයින් වෙනවා, ගෙවිලා යනවා. ඒ වෙනුවට ඒක ගෙවිලා යනකොට ඒ සන්තානයේ ලැබෙන්නෙ, සැළසෙන්නෙ මෙන්න මේ දියුණු වෙච්ච වීර්යය. මේ වීර්යය, මේ වීර්යයේ බලයෙන් එහාට මේ සල්ලක්ඛණ චිත්ත පරම්පරාව වන ධම්ම විචය සම්බොජ්ජංගය ලෙහෙසියෙන් පවත්වාගෙන යෑමට මේක උපකාර වෙනවා. ඒ ධම්ම විජය සම්බොජ්ජංගය කීවෙ එතකොට චතුර්මාර්ග ඥාණයට මේ වීර්යය උපකාර වෙනවා. ඒ නිසා කෝසජ්ජ පක්ෂය, කුසීතකම සම්පූර්ණයෙන් අයින් කරලා සම්පූර්ණ ගතයුතු ප්‍රධාන පියවර මෙන්න මේකයි කියලා අර වියගහ කරේ තබා ගත්තා වාගේ, කරත්තෙ වියගහ කරේ තබා ගත්තා වගේ ප්‍රඥාව, ශ්‍රද්ධාව කියන මේවා බලවත්ත සිතට ඇතුල් වීමෙන් මේ වීර්යය ඒකාන්තයෙන්ම කළ යුත්තක්ය කියලා වැටහෙනකොට අර වීර්යය ධුරය, ධුරයෙහි යෙදුනාවූ වීර්යයක් වශයෙන් සලකනවා. එතකොට එබඳු අවසථාවේදී පස්සට අඩිය තියන්නෙ නැතුව ක්‍රමයෙන් ඉස්සරහට යනවා. කෝසජ්ජයට, කුසීතකමට මොන අන්දමින්වත් ඉඩක් සැලසෙන්නෙ නැහැ. මොන අන්දමින්වත් හිත පස්සට ගන්න බැහැ. පය පස්සට ගන්න බැහැ. ක්‍රමයෙන් ඉස්සරහට ගිහිල්ලා අර චතුර්මාර්ග ඥාණයන්ගේ පහළ වීමට මේ වීර්යය උපකාර වෙනවා. එතකොට වීරිය සම්බොජ්ජංය කීවෙ ඒකට.

ඊළඟට පස්සද්ධි සම්බොජ්ජංගය කීවේ හිතේ කයේ දෙකේ බර අඩුකම. සැහැල්ලුකම. චිත්තයේ කයේ ඇතිවෙනවා "දරථ" කියලා' දැවිලි ගති. මේ දැවිලි, තැවිලි ගති සාමාන්‍ය වශයෙන් තේරුම් ගන්න පුළුවන් වෙනවා බලවත් ක්ලේෂයක් හිතේ පහළ වෙච්ච අවස්ථාවේදී එහෙම නැත්නම් ක්ලේෂයක් පහළ වෙන්න සූදානම් වෙන අවස්ථාවේදී සිතටයි කයටයි ලැබෙන නොසන්සුන්කමක් දැනීමෙන්. මේ නොසන්සුන්කම කොච්චරද කියනවනම් ඒ පුද්ගලයා නොමග යවන්න සමත් වෙනවා එබඳු අවසථාවේදී. නොමග ගිහිල්ලා වරදකට හිත කය යොමු කිරීමකට අරක උදව් වෙනවා. අන්තිමේදී පුද්ගලයා පුදුම අන්දමේ දුර්වල කෙනෙක් වෙනවා. එබඳු දුර්වල තත්වයකට පමුනුවණ දේවල් තමයි මේ කාය චිත්ත ,දරථ, කියලා කියන්නෙ.

ඒ කියනනෙ කායික මානසික නොසන්සුන්කම ඇති කරන ගතියයි. මේ ගතිය සන්සිඳුවගෙනයි මේ පස්සද්ධිය ඇතිවෙන්නෙ. පස්සද්ධිය ඇති වෙනකොට අර හිතේ පහළ වෙන කයේ පහළ වෙන දරථ ගති දැවිලි තැවිලි සම්පූර්ණයෙන් අයින් වෙලා හොඳට කාර්යක්ෂම වූ සිතක් කයක් පහළ වෙනවා ඒ පුද්ගලයාට. එබඳු චතුර මාර්ග ඥාණයන් සළසා ගැනීමට උපකාර වන්නා වූ ඒ විදිහෙ පස්සද්ධිය, එහෙම නැත්නම් සන්සිදිච්ච හිත, සන්සිදිච්ච කය තැන්පත් කරගෙන හොඳට තියාගෙන ඉන්න පුළුවන් වෙනවා. දවසක් වුනත් නොසෙල්වී කයයි හිතයි දෙකම තැන්පත් කරගෙන තියන්න පුළුවන් ශක්තියයි මේ පස්සද්ධිය කියන්නෙ. ඒක අර චතුර්මාර්ග ඥාණය ලබන්නාවූ අවස්ථාවේදී එකට එකතුවෙලා උපකාර වෙනවා. එතකොට පස්සද්ධි සම්බොජ්ජංගයයි.

ඊළගට සමාධිය කියන එක තේරෙනවා හුගක් දුරට මේ ඇත්තන්ට. ඒ චතුර් මාර්ග ඥාණයන් ලබා ගැනීමට උපකාර වන්නාවූ සමාධි හිතත් ඒකමයි. ඒක අන්තිමේදී දියුණු වීමෙන් මාර්ග ඥාණයට හැරෙනවා.

ඊළගට උපේක්ඛා සම්බොජ්ජංගය. උපේක්ඛා සම්බොජ්ජංගය තිබ්බේ මේ භාවනාවල් ගෙන යන්නා වූ අවස්ථාවේදී හිතේ පහළ වෙනවා ඇතැම් විටෙක කුසීතකම, ලිහිනකම හැංගිච්ච ගතියක් ඇතිවෙනවා. මතුකර ගන්න මොන අන්දමකටවත් බැරි ගතියක් තියනවා. හිත ලිහින වෙලා හැංගිලා වගේ යනවා. ඇතැම් විටෙක ඒක නැති කර ගන්න මහන්සි ගන්නකොට අන්තිමේදී මේක ඇවිස්සිලා යනවා. ඒක උද්ධච්චය කියලත් කියනවා. ඒ ලිහිනතාවය උද්ධච්චතාවයයි කියන මේ දෙක අර පොල්පිත්තේ අගමුල පාගන්නා වගේ කියලා කථාවක් තියෙනවනෙ. අන්න ඒ විදිහට වෙනවා. එක පැත්තකට ඉඩ දෙනකොට අනික් පැත්ත මතුවෙනවා. ලිහිනතාව නැති කරන්න මහන්සි වෙනකොට උද්ධච්චය ඇති වෙනවා. උද්ධච්චය නැති කරගන්න මහන්සි ගන්න කොට සමහර විටක ලිහිනතාවයට වැටෙනවා. මෙන්න මේ අන්ත දෙකට වැටෙන්න දෙන්නෙ නැතිව, ලිහිනතාවයට වැටෙන්න දෙන්නෙත් නැතුව උද්ධච්චයට වැටෙන්න දෙන්නෙත් නැතුව මධ්‍යම තත්වයේ තබා ගැනීමට උපකාර වන්නාවූ ධර්මයටයි මේ උපේක්ඛාව කිව්වෙ. ඒක අර චතුර් මාර්ග ඥාණයට උපකාර වෙන්නෙ ඉතාම සුදුසු අන්දමට. ඒක අන්තිමට දියුණු කරගෙන දියුණු කරගෙන යන්නාවූ අවස්ථාවේදී මේ උපේක්ඛාව කියන එක මුලදිත් ඇති වෙනවා. මැදදිත් ඇති වෙනවා. නියම වශයෙන් සම්පූර්ණයෙන් ඇති වෙන්නෙ අන්තිම අවස්ථාවේදි. ඒ උපේක්ෂාව ඇති වුනේ නැත්නම් මේ බොජ්ජංග අනිත් එකකටවත් සම්පූර්ණව ක්‍රියා කරන්න පුළුවන් වෙන්නෙ නෑ. සති, ධම්ම

විචය, විරිය, සමාධි, පස්සද්ධි කියන මේ එකකටවත් නියම අන්දමට සම්පූර්ණ කරගන්න ලැබෙන්නෙ නෑ. මේ උපේක්ඛාව නැතිනම්. ඒ නිසා අර දෙපැත්තට වැටෙන්නට නොදී සමවාහී තත්වයෙන සමව උසුලන්නාවූ තත්වයට වැටෙන්න ක්‍රියා කරන්න ඕනේ මේ භාවනා හිත. එතකොට මාර්ග ඥාණය ලැබෙන්නා වූ අවස්ථාවේදී විශේෂයෙන් මේක තියාගන්න ඕනේ. උපකාර වෙනවා, මෙන්න මේ තත්වයයි උපේක්ඛා සම්බොජ්ජංගය කියන්නෙ.

එතකොට මෙන්න මේ ටික අද සාමාන්‍ය වශයෙන් කල්පනාවට ගන්න ඕනේ. මේ වෙනුවට බුදුරජාණන්වහන්සේ වචන තුනක් දේශනාවේ සඳහන් කළා. විවේක නිස්සිතං, විරාග නිස්සිතං, වොස්සග්ග පරිණාමිං කියලා. මේ නිවන ලබා ගැනීමට උපකාර වන බොජ්ජංගවල ලක්ෂණ ඒකේ සඳහන් වෙන්නෙ. විවේක, විවේකය කියන්නෙ කායික විවේකය, චිත්ත විවේකය කියන මේ විවේකයෙන් යුක්ත වූ වෙන්වීම, කෙලෙසුන්ගෙන් වෙන්වීම, කලබල තත්වයෙන් වෙන්වීම. එතකොට ඒවා සැළසෙන්නෙ නිවනට සම්බන්ධ කරලා. විරාගය, නොඇල්ම ඒකත් අර නිවනට සම්බන්ධ කරලයි ලැබෙන්නෙ. වොස්සග්ග කියන්නෙ ඇතුල්වීම. එහෙම නැත්නම් අයින් කිරීම. කෙළෙසුන් අයින් කරලා නිවනට ඇතුල්වීම. ඒ කෙලෙසුන් කියන්නෙ ඔතන සාමාන්‍ය කෙලෙසුන් නෙමෙයි. නිවනට ඇතුල් වෙන්නාවූ අවස්ථාවේදී නැති කරන කෙළෙස් වශයෙන් තියෙන්නෙ. අනුෂය වශයෙන් තියෙන ඒවා. බහල කෙලෙස් ඇති වෙන්නෙ නෑ ඒ අවස්ථාවේදී. අනුෂය වශයෙන් තිබෙන්නා වූ කෙලෙස්, යටවෙලා තිබෙන්නාවූ කෙලෙස් ශක්ති ඒ අවස්ථාවේදී කැඩිලයි අර නිවනට පිවිසෙන්නෙ.

මෙන්න මේ විශේෂණ තුන පෙර කී පරිදි අදහස් ඇතුවයි බුදුරජාණන්වහන්සේ දේශනා කළේ. උපරිමාර්ගයන් සම්බන්ධව භාවනාවේ යෙදෙන යෝගාවචරයන්ට මෙන්න මේ බොජ්ජංග හත දියුණු කර ගැනීම උපකාර වෙනවා. මෙලෙස දියුණු කර ගැනීමේ දී බොජ්ජංගට්ඨානිය ධර්ම උගන්වලා තියෙනවා. මේ විදිහට බොජ්ජංගයකට සම්බන්ධව ක්‍රියා කරන හැටි තේරුම් ගන්න ඕනේ. එක බොජ්ජංගයට බාධක දේවල් දැන ගන්න ඕනේ. උපකාරක දේවල් දැනගන්න ඕනේ. හැම එකකටම බාධක තියනවා. උපකාරක තියනවා. ඒ වාගේම බොජ්ජංගට්ඨානීය ධර්ම කොටසක් පෙන්නුම් කරලා තියනවා. බොජ්ජංගට්ඨානිය කියන්නෙ බොජ්ජංග ධර්මයන් ලබා ගැනීමට උපකාර වන්නා වූ තවත් ධර්ම කොටස් වලටයි. මේවත් තේරුම් අරගන්න ඕනේ. මේවත් තේරුම් කරගෙන නොකඩවා භාවනාව ගෙනියන්නාවූ අවස්ථාවේදී බොජ්ජංග ධර්මයන් දියුණු වෙනවා.

ඒ බොජ්ජංග ධර්මයන් ක්‍රමයෙන් දියුණු වෙනකොට ඒ බොජ්ජංග ධර්මයන් දියුණු වී අර විදිහට එකට එකතු වෙලා බාධක ධර්මයන්ගෙන් අයින් වෙලා උපකාරක ධර්මයන්ගෙන් සම්පූර්ණ වෙලා මේ බොජ්ජංග ධර්මයන් එකතු වෙලා අර ධම්ම විචය සම්බොජ්ජංගය මූලික වෙලා මාර්ග ඥාණයන් පහළ වෙනවා කෙලෙස් නැති කිරීමෙන්. මේක නිවන් ප්‍රත්‍යක්ෂ කරගන්නා වූ අවස්ථාවයි. මෙන්න මේ ටික දැන් අද දවසේ තේරුම් කරගන්න ඕනෙ.

භාවනාවේ යෙදෙන යෝගාවචරයන්, මුලින්ම භාවනාවේ යෙදෙන පින්වතුන්ට මේ බොජ්ජංග ධර්මයන් සම්බන්ධව කථාකරන්න ඕනේ. ප්‍රධාන වශයෙන් කථා කරන්න ඕනේ ආරම්භයේදී බොජ්ජංග ධර්මයන් සම්බන්ධව නෙවෙයි කථාව කරන්න ඕනේ හිත සම්බන්ධවයි. සමාධිය සම්බන්ධවයි. චිත්ත ඒකාග්‍රතාවය සම්බන්ධවයි කථා කරන්න ඕනේ. හොඳට චිත්ත ඒකග්‍රතාව මුලින් තියාගන්න ඕනේ. ලැබෙන තාක් ඒ ධර්මයන් නොකඩවා මෙනෙහි කරන්න ඕනේ. නොකඩවා මෙනෙහි කරගෙන යන්නාවූ අවස්ථාවේදී ආර්ය අෂ්ටාංගික මාර්ගය වාගේම බොජ්ජංග ධර්මත් වැඩෙනවා ඉන්ද්‍රිය ධර්මත් වැඩෙනවා. මේවා මේ වැඩිලා අභ්‍යන්තරයෙහි අර සමාධිය සම්පූර්ණ වීමෙන් තමා බලාපොරොත්තු අන්දමට මාර්ග ඥාණය ලබාගන්න පුළුවන් බව කල්පනා කරන්න ඕනේ. ඒ විදිහට කල්පනා කිරීමෙන් අද මේ ධර්ම දේශනාවට හිත යොදාපු මේ පින්වතුන් මේ යෝගාවචරයන් විශේෂයෙන් කල්පනාවට ගන්නට ඕනේ අපි මේ භාවනා කරන්නෙ ප්‍රධාන වශයෙන් අදහස තියාගන්න ඕනේ නොයෙක් නොයෙක් භාවනා ක්‍රම, දේවල් මේ රටේ තියනවා. එතකොට නොයෙක් දේවල් අහන්න ලැබෙනවා. ඒ අහන්න ලැබෙන ඔක්කොම එකතු වුනහම ලොකු පටලැවිල්ලක් හිටිනවා. සමහර විට ඒ පැත්තත් බලනවා මේ පැත්තත් බලනවා එක පැත්තක්වත් අරගෙන වැඩේ යොදාගන්න හම්බ වෙන්නෙ නැහැ. නිකං කාලය ගෙවෙනවා. වෙන්නෙ මොකක්ද අර ප්‍රමාදය. ප්‍රමාදයට වැටෙන්නෙ නැතුව අර මුලින් කියපු උපදෙස් ටික හිතට අරගෙන හැකිතාක් දුරට නොකඩවා සති, සමාධි කියන මේවා දියුණු කරගන්න ඕනේ. මේවා පටන්ගන්න ඇත්තන් සම්බන්ධවයි මේ කියන්නේ. ඒවා හොඳට ගෙනියමින් ලැබෙන තාක් ධර්මයන්, මේ කරුණු හිතට ගන්න. හිතට ගන්නවා, මෙනෙහි කරනවා. ඒ වාගේම ඒවා හොඳට සම්පූර්ණ නම් එබඳු අවස්ථාවේදී තමාගේ පංච උපාදානස්කන්ධයට හිත යොදාගන්න පුළුවන් වෙනවා.

තමන්ගේ පංච උපාදානස්කන්ධයට හිත යොදන්නාවූ අවස්ථාවේදී හිත විසිරෙන්නෙ නැතුව පංච උපාදානස්කන්ධය තුළම හිත තබාගන්න පුළුවන් ශක්තියක් ලැබෙනවා නම් අන්න එදාට ඒ යෝගාවචරයාට තමා

බලාපොරොත්තු වන්නාවූ අර්ථය ලෙහෙසියෙන් සම්පූර්ණ කර ගැනීමට, නිවන ප්‍රත්‍යක්ෂ කර ගැනීමට පුළුවන් බව කල්පනා කරගන්න ඕනේ. ඒ නිසා අද දවසේදී මේ ධර්ම දේශනාවට කන් දීමෙන් වෙනදා වාගේම මහා පුන්‍ය සම්භාරයක් අත්කර ගැනීමෙන්, තම තමන් දියුණු කරගත් ඒ වටිනා කුසල සමූහයත් මේ රැස් කරගත්තාවූ කුසල් සම්භාරයේ බලයත් හේතුකොට ගෙන තම තමන්ගේ භාවනා වලට බාධක ධර්ම තිබෙනවනම් ඒවා ඈයින් වෙලා උපකාරක ධර්මයන් ලඟා කරගෙන අවසානයේ බලාපොරොත්තු වන්නා වූ අමා මහ නිවන ප්‍රත්‍යක්ෂ කර ගැනීමට හැකිවේවා කියලා ප්‍රාර්ථනා කර ගන්න.

*සාධු! සාධු!! සාධු !!!*

*සියළු සත්වයෝ සුවපත් වෙත්වා!*

දේශකයාණන් වහන්සේ :
මීතිරිගල නිස්සරණ වන සෙනසුන්පති
**පූජ්‍ය මාතර ශ්‍රී ඥාණාරාම ස්වාමීන් වහන්සේ**